www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කීර්ති බාලසූරිය සහෝදරයාගේ ජීවිතය හා අරගලයේ චිරකාලීන වැදගත්කම

## The enduring significance of the life and work of Comrade Keerthi Balasuriya

**2012 දෙසැම්බර් 18**

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා ලෝක සමාජවාදී වෙබ් අඩවිය ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) පූර්වගාමී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (විකොස) ප්‍රධාන ලේකම්ව සිටි කීර්ති බාලසූරිය සහෝදරයාගේ අභාවයෙන් 25 වන වසර සමරනු ලබයි.

කීර්ති සහෝදරයා විසිවන සියවසේ අග භාගයෙහි සිටි අතිශයින්ම කැපීපෙනෙන ට්‍රොට්ස්කිවාදයේ නියෝජිතයින් අතරින් කෙනෙකි. හදිසි මෙන්ම ඛේදජනක ලෙස නොමේරූ ඔහුගේ මරනය 1987 දෙසැම්බර් 18දා උදෑසන සිදුවිය. ඔහු හෘදයාබාධයකින් මිය ගියේ සිය 39වන උපන් දිනයේ සිට මසකට මඳක් වැඩි කාලයක් ගෙවීමෙන් පසුවය.

කීර්ති බාලසූරිය නැගී ආවේ ශ්‍රී ලංකාවේ පොහොසත් ට්‍රොට්ස්කිවාදී සම්ප්‍රධාය තුලින්ය. තරුනයෙකු වශයෙන් ඔහු, මයිකල් පැබ්ලෝ හා අර්නස්ට් මැන්ඩෙල්ගේ ජාත්‍යන්තර ලේකම් මන්ඩලයට අනුබද්ධව එහි ලංකා ශාඛාව ලෙස පෙනී සිටි ලංකා සමසමාජ පක්ෂය (ලසසප) 1964දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයෙන් යුත් ධනපති හවුල් ආන්ඩුවකට ඇතුල්වීමට විරුද්ධවූ කොටස් සමග පෙලගැසුනි.

කීර්ති සහෝදරයාගේ ජීවිතයේ සන්ධිස්ථානය, ඔහු වටහාගෙන සිටි ආකාරයට, ට්‍රොට්ස්කිවාදී යයි කියාගත් පක්ෂයක් පලමු වතාවට ධනපති ආන්ඩුවකට සම්බන්ධවීම මගින් සලකුනු කල ලසසප පාවාදීම සමග බැඳුනු ප්‍රශ්න, ඊට පෙර දශකය පුරා ලසසපය සින්ඩිකල්වාදයට, පාර්ලිමේන්තුවාදයට හා සිංහල ජනතාවාදයට අනුගත වීමට වඩා දුර දිග ගිය ප්‍රශ්න වීමේ ප්‍රතිපල වශයෙන් ලංකාව තුල බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදීන් කල මැදිහත්වීම තුලින් සටහන් කෙරුනි. "1964 මහා පාවාදීමට" පැබ්ලෝ හා මැන්ඩෙල් සහාය හා අනුග්‍රහය දක්වා තිබුනි.

එය වනාහි, ධනවාදයේ පශ්චාත් යුද කාලීන යලි තහවුරු වීමේ කොන්දේසි යටතේ, ට්‍රොට්ස්කිවාදය ප්‍රතිවිප්ලවවාදී ස්ටැලින්වාදයේ ද සමාජ ප්‍රජාතන්ත්‍ර නිලධරයන්ගේ ද යටත් විජිත රටවලදී ධනේශ්වර ජාතිකවාදයේ ද තුරුල්ලට හරවා යැවීමට උත්සාහ දැරූ හතරවන ජාත්‍යන්තරය තුල වර්ධනයවූ උග්‍ර අවස්ථාවාදී ප්‍රවනතාවක ඵලය විය. ලසසපයේ පාවාදීමට පිලිතුරු දීමටත් නොනවතින විප්ලවයේ ක්‍රියාමාර්ගයේ පදනම මත විප්ලවවාදී කම්කරු පන්ති පක්ෂයක් ගොඩනැගීමටත් පැබ්ලෝවාදී අවස්ථාවාදයට එරෙහිව 1953දී පිහිටුවන ලද හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගෙනගිය අරගලයේ පාඩම් උකහා ගැනීමත් හා එයට බැඳී ගැනීම ඉල්ලා සිටියේය.

1968දී පැවැත්වූ විකොස ආරම්භක සමුලුව විසින් 19 වැනි වියේ පසුවූ කීර්ති එහි ප්‍රධාන ලේකම් ලෙස තෝරා ගත්තේය. විකොස වහාම හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සමග ඒකාබද්ධ වීමට උත්සුක විය.

1985-86 බ්‍රිතාන්‍ය කම්කරු විප්ලවවාදී පක්ෂයේ (කවිප) භේදය සමග ජාත්‍යන්තර කමිටුව මත ට්‍රොට්ස්කිවාදීන්ගේ අධිකාරය යලි තහවුරු කල සාර්ථක අරගලය තුල කීර්ති සහෝදරයා ඉටුකල භූමිකාව ඊටත් වඩා තීරනාත්මක විය.

අද දින අපි යලි ප්‍රකාශයට පත් කරන කීර්ති සහෝදරයාගේ ජීවිතය පිලිබඳව ලෝසවෙඅ කතෘ මන්ඩලයේ සභාපති ඩේවිඩ් නෝර්ත් විසින් කල දීර්ග විමසුම පැහැදිලි කරන පරිදි, විකොස නායකයා කම්කරු පන්තියේ මූලෝපායික අත්දැකීම් හා මාක්ස්වාදී ව්‍යාපාරයේ ඉතිහාසය පිලිබඳව ඔහුට පැවති මහත් දැනුම් සම්භාරය, කවිපය අවස්ථාවාදය තුලට ඇදී යාම පිලිබඳ ජාත්‍යන්තර කමිටුවේ සවිස්තරාත්මක හෙලිදරව් කිරීම් සඳහා ප්‍රතිපදානයක් විය.

කීර්ති සහෝදරයාගේ සමස්ත දේශපාලන ජීවිතයම දිගහැරුනේ සංකීර්න හේතූන් කරනකොටගෙන කම්කරු පන්තිය හා පීඩිත ජනතාවන්, ස්ටැලින්වාදයේ හා සමාජ ප්‍රජාතන්ත්‍රයේ පාවාදීම් ද දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ලෝක ධනවාදයේ ප්‍රතිස්ථාවරත්වය ද සමග බැඳී තිබුනු තතු හමුවේ, ඔවුන්ගේ පක්ෂපාතිත්වය ජාත්‍යන්තර කමිටුවට නොව වෙනත් සංවිධාන කෙරෙහි පැවති අවධියක් තුලය.

සම්භාව්‍ය මාක්ස්වාදීන් හා හතරවන ජාත්‍යන්තරය විසින් වර්ධනය කල විද්‍යාත්මක ඉදිරිදර්ශනය මත පදනම් වෙමින් කීර්ති සහෝදරයා කම්කරු පන්තියට ආදේශකයක් ලෙස ස්ටැලින්වාදී නිලධරය වෙත නෙත් යොමුකල හෝ ගොවීන් මත පදනම්වූ "මහජන යුද්ධය" පිලිබඳ මාඕගේ ජාතිකවාදී ක්‍රියාමාර්ගයේ දෘෂ්‍යමාන සාර්ථකත්වය මගින් මෝහනයට පත්වූවන් කෙරෙහි දැක්වූයේ දැඩි විරෝධයකි.

සමාජවාදය සඳහා අරගලය පදනම් කල හැකි එකම බලවේගය ජාත්‍යන්තර කම්කරු පන්තිය පමනක් බවත්, විප්ලවවාදී මාක්ස්වාදීන්ගේ මුඛ්‍ය කර්තව්‍ය වන්නේ ලෙනින්ගේ සුප්‍රකට කියමනක් වන සමාජවාදී විඥානයෙන් කම්කරු පන්තිය සන්නද්ධ කිරීමත් එහි දේශපාලන ස්වාධීනත්වය සඳහා සටන් වැදීම බවත් ඔහු ඒත්තුගෙන සිටියේය.

කීර්තිගේ අවමංගල්‍යයට සහභාගී වූ ජාත්‍යන්තර කමිටුවේ නියෝජිතයෙක්, එලඹෙන කාලපරිච්ඡේදයේදී විප්ලවකාරී නැඹුරුවකින් යුත් කම්කරුවන් හා තරුනයින්ගේ ගුරුවරයා ලෙස ඉස්මතු වනු ඇත්තේ මාඕලා, හෝචිමිංලා, නේරුලා හා කැස්ට්‍රෝලා වැනි ධනේශ්වර ජාතිකවාදී නායකයින් හා විවිධාකාර ස්ටැලින්වාදීන් නොව, කීර්ති බාලසූරිය බවට අනාවැකි පල කලේය.

විසිපස් වසරකට පෙර එම අනාවැකිය මගින් සුලු පිරිසක් තුල හැරෙන්නට අන් සියල්ලන් තුල ගම්‍ය විය හැකිව තිබුනේ එඩිතර ප්‍රකාශයක් ලෙස නොව හුදු බහුවලයක් ලෙසින්ය. කෙසේ

වුවත් ඉතිහාසය ඕනෑවටත් වඩා එය සනාථකර තිබේ.

කීර්තිගේ අභාවයෙන් පස් වසරකටත් අඩු කාලයක් තුල, ස්ටැලින්වාදී නිලධරය ධනවාදය පුනස්ථාපනය කරද්දී සෝවියට් සංගමය හා නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍රයන් අභාවයට ගොස් තිබේ.

මහජන චීන සමූහාන්ඩුව හා වියට්නාම් සමාජවාදී සමූහාන්ඩුව නාමික වශයෙන් තවමත් පවතින්නේය. එහෙත් එම දෙරටෙහිම ස්ටැලින්වාදී නිලධරය, ධනවාදය පුනස්ථාපනය කරමින් එක්සත් ජනපද, යුරෝපීය, ජපන් හා තායිවාන අන්තර්ජාතික සංගතයන් හා අලුතෙන් පොහොසත්වූ නැගී එන ස්වදේශීය ධනපතීන්ගේ නව පන්තියක් වෙනුවෙන් කම්කරු පන්තිය නිර්දය ලෙස සූරාකෑම මෙහෙයවති.

එසේම අධිරාජ්‍යවාදයේ විරුද්ධවාදීන් ලෙස පෙනී සිටිමින් සමාජවාදී වැකි හඬතැලූ ධනපති ජාතිකවාදී නායකයින්ගේ තත්වය කුමක් ද? සෝවියට් ස්ටැලින්වාදී නිලධරයේ අනුග්‍රහය අහිමිවූ කැස්ට්‍රෝ තන්ත්‍රය යුරෝපීය, කැනේඩියානු හා ලතින් ඇමරිකානු ආයෝජනයන්ට සිය දොරවල් ඇර දෙමින් පෙර නොවූ විරූ ලෙසින් ගැඹුරු වන සමාජ අසමානතාවය හා දුප්පත්කම වගාකරමින් සිටියි. මේ අතර තන්ත්‍රය එක්සත් ජනපද ඩොලර් නිදහසේ සංසරනය වීමට ඉඩ හැර තිබෙන අතර රාජ්‍ය ව්‍යවසායික ක්ෂේත්‍රයේ විශාල පදාසයන් වසා දමයි.

පලස්තීන විමුක්ති සංවිධනය හා පලස්තීන අධිකාරයේ නායකයෝ එක්සත් ජනපද හා ඊස්රායල් පොලිස්කාරයින් ලෙස කටයුතු කරති.

ජනතාව රැවටීමේ උත්සාහයක නිරත වෙමින් කොන්ග්‍රස් සමාජවාදය ලෙස පාරම්බෑ ඉන්දියාවේ කොන්ග්‍රස් පක්ෂය, රාජ්‍ය මූලික සංවර්ධනය බොහෝ කලකට පෙරම අතහැර දැමූහ. ඉන්දියාව ලෝක ධනවාදයේ ලාභ ශ්‍රම තටාකයක් බවට හැරවීමේ ව්‍යායාමයක එය යෙදී සිටියි. විදෙස් පිලිවෙතේදී ඉන්දියානු ධනේශ්වරය එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමග මූලෝපායික සන්ධානයක් ඇතිකරගැනීමේ හා තමන්ගේම මිලිටරි ශක්තිය තරකර ගැනීමේ උවමනාව මත නොබැඳි පිලිවෙත ඉවත දමා ඇත.

ඉන්දියාවේ "මහජන" ස්ටැලින්වාදී පාර්ලිමේන්තු පක්ෂ, කොන්ග්‍රසය ප්‍රමුඛ ආන්ඩු ගනනාවක් ඔසවා තබමින් ධනපති පන්තියේ "නව ආර්ථික පිලිවෙතට" විවෘතව සහයෝගය දුන්හ. ඔවුහු බලයේ සිටින ප්‍රාන්තවල ඔවුන්ගේම වචන වලින් හඳුන්වා ගන්නා "ආයෝජන හිතවත්" ප්‍රතිපත්ති අනුගමනය කරති.

මෙරට තුලදී විසිපස් වසරක ඓතිහාසික තීන්දුව තීරනාත්මක බවින් අඩු නැත. ලසසප හා ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය විසින් කම්කරු පන්තිය දේශපාලනිකව ධනේශ්වරයට යටත්කර තැබීමේ කොන්දේසි යටතේ ශක්තිය උකහාගත් සුලු ධනපති සංවිධාන අන්ධ පථයක් බව සනාථ කර තිබේ.

ජනතා විමුක්ති පෙරමුන දක්ෂිනාංශික එක්සත් ජනතා නිදහස් සන්ධානයට පාර්ලිමේන්තුව තුල සහයෝගය දී තිබෙන අතර දෙමල සුලුතරයට එරෙහි සිංහල ධනේශ්වරයේ වර්ගවාදී යුද්ධයට උද්‍යෝගිමත්ව සහයෝගය දුන්හ. දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කල හැකි එකම සමාජ බලවේගය වන සිංහල හා ජාත්‍යන්තර කම්කරු පන්තිය වෙත කිසිදු ඇමතීමක් කිරීමට විරුද්ධ වූහ. ඒ වෙනුවට ඔවුන් උත්සාහ කලේ, ඉන්දියාවට හා අධිරාජ්‍යවාදී බලවතුන්ට ඇමතීම මගින් උතුරේ හා නැගෙනහිරේ ධනපති රාජ්‍යයක් කපා වෙන්කර ගැනීමටය.

එක්සත් ශ්‍රී ලංකා හා දෙමල ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සටනේදී කම්කරු පන්තියේ නායකත්වය යටතේ සිංහල හා දෙමල පීඩිතයන් විප්ලවවාදීව බලමුලු ගැන්වීම පිනිස විකොස-සසප ඉදිරිපත්කල ඉදිරිදර්ශනය ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර හා සමාජ අභිලාෂයන් මුදුන්පත් කර ගැනීමේ එකම ශක්‍ය මාධ්‍ය බව පෙන්නුම්කර තිබේ.

නරුම ලෙස තමන් ට්‍රොට්ස්කිවාදීන් ලෙස හඳුන්වා ගැනීමට උත්සාහ ගත් පැබ්ලෝවාදීන් සම්බන්ධයෙන් ගත් කල ඔවුහු, අධිරාජ්‍යවාදී යුද්ධයට සහාය දෙමින් ධනපති කප්පාදු පැටවීමට වැඩ කර තිබෙන ජර්මනියේ වාම පක්ෂයේ සිට ඉතාලියේ රිෆොන්ඩාසියොනි කොමියුනිස්ටා දක්වා වන විවිධාකාර රාජ්‍යයේ පක්ෂ බදාගෙන සිටිති.

මැන්ඩෙල්වාදී "ජාත්‍යන්තරය" සමග සන්ධානගතව සිටින වත්මන් ශ්‍රීලංකා කන්ඩායම වන නව සමසමාජය, 1977 වෙලඳපොල ගැති ප්‍රතිසංස්කරනයන්ට මුලපිරූ හා 1983දී දෙමල විරෝධී යුද්ධය දියත් කල ධනේශ්වරයේ සම්ප්‍රදායික දක්ෂිනාංශික පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය සමග "ප්‍රජාතන්ත්‍රය" සඳහා හවුලකට ඇතුල්වී සිටින සංවිධානයකි.

කම්කරු පන්තියේ දේශපාලන අධ්‍යාපනය හා එහි බලමුලු ගැන්වීම සිය දිශාවනතිය කරගත් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ට්‍රොට්ස්කිවාදයේ හා සම්භාව්‍ය මාක්ස්වාදයේ අව්‍යාජ හඬබවට සැක කල හැක්කේ කාට ද? සියලු ප්‍රධාන දේශපාලන, සමාජ හා ඓතිහාසික ප්‍රශ්න ස්වාධීන කම්කරු පන්තික දෘෂ්ටි ආස්ථානයකින් දෛනික පදනමක නිර්නය කරන *ලොසවෙඅ* තුලින් එය, කම්කරු පන්තිය ජාත්‍යන්තර සමාජවාදී ඉදිරිදර්ශනයකින් සන්නද්ධ කිරීමට සටන් වදියි.

විසිපස් වසරක ආලෝකය තුල කීර්ති සහෝදරයාගේ ජීවිතය හා අරගලය වැදගත්කමින් හීනවී ගොස් තිබෙනවා නොව, නව ජවයකින් නැගී සිටියි.

මහා අවපාතය හා එය දොර විවරකල ලෝක යුද්ධයේ පටන් ලෝක ධනවාදය බරපතලම අර්බුදයකට මුහුනපා සිටින තතු හමුවේ කම්කරුවන් හා තරුනයින්ට ධනවාදයට එරෙහිව සටන් වැදීමට වඩ වඩාත් බල කෙරෙයි. ඔවුන් කීර්ති බාලසූරිය සහෝදරයාගේ දේශපාලන චරිතාපදානය, දිරිමත් හා මූලධර්මාත්මක දේශපාලන අරගලයේ ආවේශ ගන්වන නිදසුනක් ලෙස දැකගන්නවා ඇත. ඊටත් වඩා වැදගත් ලෙස, ඔහු විසින් ආරක්ෂා කර වර්ධනය කල මාක්ස්වාදී දේශපාලන සංකල්ප තුල ඔවුන්, ජාත්‍යන්තර කම්කරු පන්තිය දේශපාලනිකව ස්වාධීනව හා විප්ලවකාරීව බලමුලු ගැන්වීමේ අරගලයට මග පෙන්වන න්‍යායික හා දේශපාලන අවි සොයාගන්නවා ඇත.

**හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටු ප්‍රකාශය**

***

එලඹෙන වසරේදී ලෝක සමාජවාදී වෙබ් අඩවිය කීර්ති සහෝදරයාගේ ලිපි ලේඛන ජාත්‍යන්තර ප්‍රෙක්ෂකත්වයක් හමුවේ තබනු ඇත. මෙයට 1970 වසරේ මුලින්ම පලකරන ලද සුලු ධනේශ්වර ජවිපෙ පිලිබඳව ඔහු විසින් කරන ලද දීප්තිමත් හා අනාගත වක්තෘමය හෙලිදරව්ව වන *ජනතා විමුක්ති පෙරමුනේ පන්ති ස්වභාවය හා දේශපාලනය* යන කෘතිය ද ඇතුලත් වනු ඇත.

කීර්ති බාලසූරියගේ අභාවයෙන් විසි වසරක් යන ප්‍රකාශනය ද කියවන ලෙස කතුවරයා ඉල්ලා සිටියි.

© www.wsws.org